# 11 වන දවස

## ඔබගේ ශ්‍රී නාමය සුවිශුද්ධ වේවා !

ශුද්ධවූ දෙවියන් වහන්සේට අප ගැන ශුද්ධවූ සැලැස්මක් ඇත. අප හැම දෙනෙකුට ම තමන් ගැන සැලැස්මක් ඇත. දෙමව්පියෝ තම දරුවන් පිළිබඳව සැලසුම් අඳිති. තරුණ තරුණියෝ තම අනාගතය ගැන සැලසුම් කරති. බොහෝ විට මෙම සැලසුම් ක්‍රියාත්මක නොවෙයි. එම සැලසුම් අපට යහපතක් ගෙන දෙයි ද නැතහොත් අයහපතක් ගෙන දෙයි ද කියා අප දන්නේ නැත. අපගේ ජීවිතය පිළිබඳව හොඳම ඉතා උත්කෘෂ්ඨතම සැලසුම ඇත්තේ දෙවියන් වහන්සේට ය. අප තුළ ඉටුවිය යුත්තේ ශුද්ධවූ දෙවියන් වහ්නසේට අප ගැන ඇති සැලැස්ම ය. එය අපගේ සැලසුම්වලට පටහැනි විය හැක. අපගේ ඥානයට ගෝචර නොවිය හැක. එහෙත් දෙවිඳුන්ගේ සැලසුම අපට ඇති අසීමිත ආදරය නිසා ම ඇතිවූවකි. අප ඉපදෙන්නටත් පෙර සිට ම එම සැලසුම දෙවිඳුන් තුළ විය. එම නිසා දෙවියන් වහන්සේට අප පිළිබඳව තිබෙන සැලසුම එලෙස ම ක්‍රියාත්මක වුවහොත් ඊට වඩා යහපතක් අපට නැත.

**''මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. නුඹේ උපතට පෙර, මම නුඹ කැප කළෙමි''** (ජෙරමියා 1:5).

**දවස පුරා :-**
- ✵ **''දෙවිඳුනි, ඔබවහන්සේට අප ගැන ඇති සැලැස්ම එලෙස ම සිදුවන්නට සලසනු මැනව්''** කියා දවස පුරා යදිමු.
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 146